www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ට්‍රම්ප් කල් යල් බලමින් සිටියත් ඉරානයට එරෙහි යුද්ධය සූදානම් කිරීම දිගටම කෙරෙනු ඇත

Trump bides his time, but the preparations for war against Iran will continue

**2020 ජනවාරි 09**

ඉරාකයේ එක්සත් ජනපද (එජ) කඳවුරුවලට එරෙහිව බැලිස්ටික් මිසයිල ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව එජ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් බදාදා කල කතාව සංගත මාධ්‍යය විසින් ප්‍රසංසාවට පත් කෙරුනේ ව්‍යසනකාරී නව ලෝක අධිරාජ්‍යවාදී යුද්ධයක් අද්දරට ලෝකය ගෙන ආ ආතතීන් ලිහිල් කිරීමක් වශයෙනි.

"ට්‍රම්ප් ඉරානය සමඟ තවදුරටත් මිලිටරි ගැටුම් වලින් පසුබසියි" යැයි *නිව්යෝක් ටයිම්ස්* ප්‍රකාශ කලේය. සීඑන්එන් කියා සිටියේ එජ ජනාධිපති ඉරානය සමඟ "ගැටුම කරාවූ මාවතෙන්" ඉවත්ව යන බවයි. "සහනය" ගැන සහ යුද මෙහෙයුමෙහි "තියුනු බව අඩුවීමක්" පෙනෙන්නට තිබුනු බව අන්‍යයෝ කථා කලහ.

යුද තර්ජනය පහව යන බවට සියලු කතා වල විශ්වසනීයත්වයේ මාත්‍රයක් පවා නැත. ඉරානයට "ශ්‍රේෂ්ඨ අනාගතයක්" සඳහා වූ ඔහුගේ ආශාව සහ "සාමය සොයන සියලු දෙනා සමඟ සාමය වැලඳ ගැනීමට ඇති සූදානම" පිලිබඳ ව ට්‍රම්ප් ගේ කතාවල මුසාවන්ට වඩා වෛෂයික පදනමක් එයට නැත.

ඔහුගේ ප්‍රකාශයේ සියලු අත්‍යවශ්‍ය කරුනු පැහැදිලි කරනා පරිදි, ටෙහෙරානය සහ ප්‍රධාන ලෝක බලවතුන් අතර න්‍යෂ්ටික ගිවිසුම ට්‍රම්ප් විසින් 2015 දී අවලංගු කිරීමත් සමඟ ආරම්භ කෙරුනු යුද තර්ජනය තීව්‍ර වෙමින් පවතී. කිසිවෙකුටත් ඒ ගැන කිසිදු සැකයකට ඉඩ තබා ගත යුතු නැති වන්නේ ඉරානයට එරෙහි ඍජු මිලිටරි ප්‍රහාරයක් තාවකාලිකව කල් දමනු ලැබ ඇතත්, ඒ නිසාවෙන්ම එය පැමිනෙන විට එය වඩාත් ලේ වැකි හා විනාශකාරී වනු ඇති බවයි.

ජෙනරාල් සුලෙයිමානිගේ ඝාතනයට ප්‍රතිචාර වශයෙන් ඉරානයේ ප්‍රහාරය පැහැදිලිවම තුවාලකරුවන් බිහිකිරීමට අදහස් නොකෙරිනි. එහෙත් වොෂින්ටනය මෙය සලකන්නේ "ප්‍රති- තීව්‍ර" කිරීම සඳහා හේතුවක් ලෙස නොව එහි මූලෝපායික අරමුනු කරා යාමේ උපායශීලී අවස්ථාවක් ලෙස ය. එජ පූර්න යුද්ධයකට සූදානම් නැති කොන්දේසි යටතේ ඇමරිකානුවන්ට තුවාල සිදු නොවීම යන කාරනාව විසින් ක්ෂනික ප්‍රතිප්‍රහාරයකට අනදීම සඳහා වූ ට්‍රම්ප් මත පීඩනය අඩු කලේය. සුලෙයිමානි ඝාතනය කිරීම සඳහා ට්‍රම්ප් නියෝග යේ හදිසිභාවය නිසා එජ හමුදාවට ආක්‍රමනශීලී හමුදා නැවත ස්ථානගත කිරීමක් සඳහා නම් කාලය නොමැති විය. ඊලඟ අනිවාර්ය ප්‍රකෝපකරනය සිදු කරන විට, එම උපායික දුබලතාවයට පිලියම් යොදා තිබෙනු ඇත.

ට්‍රම්ප්ට පැවසීමට තිබූ බොහෝ දෑ ඉරානය සහ ජෙනරාල් කසිම් සුලෙයිමානි යන ද්විත්වයම හෙලා දකිමින් හා අපහාසයට ලක් කරමින් කලින් කල කථාවලින් හා ට්විට් පනිවිඩවලින් ප්‍රතිචක්‍රීකරනය කරන දෑ විය. නමුත් ට්‍රම්ප් පැවසූ ඕනෑම දෙයකට වඩා වැදගත් වන්නේ ඔහුගේ කතාව වේදිකා ගත කල ආකාරයයි. පෙර නොවූ විරූ ලෙස ව්‍යවස්ථාමය පිලිවෙත් (ප්‍රොටෝකෝලය) උල්ලංඝනයක කරමින්, ට්‍රම්ප් ජාතිය ඇමතුවේ නිල ඇඳුමින් සැරසුනු ඒකාබද්ධ මාන්ඩලික ප්‍රධානීන් සියලු දෙනා මෙන්ම උප ජනාධිපති මයික් පෙන්ස්, රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝ සහ ආරක්ෂක ලේකම් මාර්ක් එස්පර් පිරිවරාගෙනය. මීට පෙර පැවති සෑම විශාල අර්බුදයක් හෝ හමුදා මැදිහත්වීමකදීම ඒ පිලිබඳ නිවේදනය ඕවල් කාර්යාලයේ ඔහුගේ මේසය පසුපසින් අසුන්ගත් ජනාධිපතිවරයකු විසින් සිදු කෙරින. මෙම දසුනෙන් අදහස් කෙරුනේ ට්‍රම්ප් මිලිටරි ජුන්ටාවක නායකයා ලෙස ඉදිරිපත් කිරීමය.

මෙවර හමුදා පෙනී සිටීම මගින් යැවීම කල පනිවිඩය කුමක්ද? ට්‍රම්ප් වේදිකාවට ඇවිද යෑමෙන් පසු ඔහුගේ ප්‍රකාශයට හිටි අඩියේ පෙරවදනක් ඉදිරිපත් කලේය: "මම එක්සත් ජනපදයේ ජනාධිපති වන තාක් කල් ඉරානයට න්‍යෂ්ටික අවියක් තබා ගැනීමට ඉඩ දෙනු නැත." "සුබ උදෑසනක්" යැයි පැවසීමටද පෙරම, ඉරානය මත තව ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා ප්‍රධාන කඩතුරාවක් ඔහු ඉදිරිපත් කලේ ඒ අයුරිනි.

ට්‍රම්ප් කෙරෙන් දිස්වූයේ තමාව පාලනය කර ගැනීමට වෙර දරන මිනිසෙකුගේ පෙනුමකි. ඔහුගේ මුහුන රතු වී තිබූ අතර ඔහු දැඩි ලෙස හුස්ම ගනිමින් සිටියේය. ප්‍රසිද්ධව පෙනී සිටීමට පෙර දොර වැසූ කාමර තුල කෝපාවිෂ්ට වාද-විවාද තිබිනි යයි නිගමනය කිරීමෙන් වැලකී සිටීම දුෂ්කර ය.

"පෙර කිසිම විටෙක ටත් වඩා දරුනු ලෙස ඔවුන්ට පහර දෙනවා" යනුවෙන්ද, "ඉරානය විසින් ඕනෑම එක්සත් ජනපද පුද්ගලයෙකුට හෝ ඉලක්කයකට පහර දෙන්නේ නම් එක්සත් ජනපදය ඉක්මනින් හා සම්පූර්නයෙන් ආපසු ප්‍රති ප්‍රහාර දෙනු ඇත, සමහර විට අසමානුපාතික ලෙස යනුවෙන්, එක්සත් ජනපද කොන්ග්‍රසයට " ට්විටර් මගින් දැනුම් දෙමින් ද, පසුගිය සතියේ ඔහු තර්ජන ගනනාවක්ම එල්ල කර තිබින.

ට්‍රම්ප් තම තර්ජන සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඇයි? එයට වඩාත් විය හැකි හේතුව වන්නේ ඉක්මන් ක්‍රියාමාර්ගයක් හේතුවෙන් හමුදා ව්‍යසනයක් සිදුවිය හැකි බවට ඒකාබද්ධ මාන්ඩලික ප්‍රධානීන් විසින් ට්‍රම්ප්ට අනතුරු ඇඟවීමයි.

ඇෆ්ගනිස්ථානයේ සිට තුර්කිය දක්වා ඉරානයේ දේශසීමා වල යොදවනු ලැබ ඇති එජ භටයන් 70,000 ක් පමන සමග කලාපයේ ස්ථානගත කර ඇති තවත් දස දහස් ගනනක් හමුදා කොන්ත්‍රාත් කරුවන් සහ නාවික හමුදා භටයින් ආරක්ෂාව සූදානම් කිරීමට පෙන්ටගනයට කාලය අවශ්‍ය වෙයි. මීලඟ වටයේ එජ ප්‍රහාරයන්ට පිලිතුරු ලැබෙනු ඇත්තේ එජ කඳවුරු, ගුවන් තොටුපලවල්, යුධ නැව් සහ ගුවන් යානා ගෙන යන නැව් මතට එල්ල කරන ඉරාන මිසයිල වැස්සකින් බව එජ හමුදාව දනී. 1991 සහ 2003 දී වඩාත්ම අඩු බලසම්පන්න සතුරෙකු වූ ඉරාකයට එරෙහි එජ යුද්ධ වලදී ඒ සදහා සූදානම් වීමට වොෂිංටනයට මාස කිහිපයක් අවශ්‍ය විය.

වොෂිංටන්හි යුද සැලසුම්කරුවන්ගේ දේශපාලන සලකා බැලීම් ද තිබේ. දෙවන ලෝක යුද්ධයේ අවසානයෙන් පසු

නොදුටු මට්ටමේ ප්‍රචණ්ඩත්වයන් සඳහා ජනගහනය මානසිකව හැඩගැස්වීම සඳහා සහ යුද වාදී ප්‍රචාරයන් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ. කීකරු සංගත මාධ්‍යයන්හි පිටුබලය සහිතව, මෙම ප්‍රචාරක ව්‍යාපාරයට එක්සත් ජනපදය විසින් න්‍යෂ්ටික අවි භාවිත කිරීම පිලිග ැනීම සඳහා ඇමරිකානු ජනතාව හැඩගැස්වීම සඳහා උත්සාහයන්ද ඇතුලත් වනු ඇත. විශේෂයෙන් කම්කරු පන්තිය ලොව පුරා මහජන අරගලවලට අවතීර්න වෙමින් සිටින විට තතු තුල , සුලෙයිමානිගේ ඝාතනයෙන් ඇවිස්සුනු ඉරානයේ සහ මැදපෙරදිග රටවල පැවති මහජන විරෝධතා, එජ පූර්න යුද්ධයකින් මුදා හරිනු ඇති කැලඹීම් පිලිබඳ ඇඟවීමක් සපයයි.

ට්‍රම්ප්ගේ කතාවේ ඇති හුදෙක් වැදගත් අංග දෙක වූයේ "අමතර දන්ඩනීය ආර්ථික සම්බාධක" පැනවීමට ඔහු දුන් පොරොන්දුව සහ නේටෝව "මැද පෙරදිගට බෙහෙවින් වැඩිව නිමග්න වීමට" ඔහු කල බල කිරීමයි.

නව සම්බාධක පිලිබඳව කිසිදු තොරතුරක් ලබා දී නොමැති අතර, ඉරානයේ ආර්ථිකය බිඳ දැමීමට සහ එහි ජනතාව සාගින්නෙන් පෙලා යටත් කර ගැනීම සඳහා වන "උපරිම පීඩනය" දැමීමේ ව්‍යාපාරය තවත් තීව්‍ර කිරීමට වොෂින්ටනයට තව කොපමන දුරට හැකි වේදැයි සිතීම දුෂ්කර ය.

නේටෝව සම්බන්ධයෙන් ගත් කල, වොෂින්ටනය යලිත් වරක් 2003 දී මෙන් "කැමතිවුන්ගේ හවුලක්" එක්රැස් කිරීමට වෑයම් කරයි. සාපරාධී යුද්ධයක් සඳහා වන තම සූදානම තුලට යුරෝපීය බලවතුන් ගෙන ඒමට හැකි යැයි විශ්වාස කිරීමට සෑම හේතුවක්ම එයට තිබෙන්නේ, සුලෙයිමානිගේ ඝාතනයට ඔවුන්ගේ බියගුලු ප්‍රතිචාර දැක්වීමේදී ඔවුන් සිය සියලු හෙලාදැකීම් ටෙහෙරානය වෙත සංකේන්ද්‍ර කල තතු තුලය. එජ අධිරාජ්‍යවාදය මෙන්ම ධනවාදී යුරෝපය ද තමන්ගේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා සහ නැගී එන සමාජ ආතතීන් විසින් යුද්ධයට තල්ලු කරනු ලබයි..

ඉරානයට එරෙහි යුද්ධයකදී නොවැලැක්විය හැකි ලෙසම රට තුල ඉතාම මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහෝසි කිරීමද සමඟ සිදුවනු ඇත. ඉහල හමුදා නිලධරය ඉදිරියේ ට්‍රම්ප්ගේ කතාවේ අසාමාන්‍ය ඡේද වලින් එකක් වූයේ, ඔබාමා පාලනාධිකාරය එජ ගිනුම්වල තිබූ ඉරාන තැන්පතු නිදහස් කල 2015 න්‍යෂ්ටික ගිවිසුමට අත්සන් තැබීම මගින් ත්‍රස්තවාදයට අරමුදල් සපයමින් එජ කඳවුරුවලට වෙඩි තැබූ මිසයිල සඳහා මුදල් ගෙවීය යන චෝදනා ය. මෙය වනාහි හිටපු ඇමරිකානු ජනාධිපතිවරයෙකුට එරෙහි රාජද්‍රෝහී චෝදනාවකට සමාන වන අතර මෙය ඇමරිකානු කම්කරුවන් හා තරුනයින් අතර යුද්ධයට එරෙහි මහජන විරෝධයට එජ රජය කටයුතු කරනු ඇත්තේ කෙසේද යන්න පිලිබඳ පූර්ව-අත්දැකීමකි.

ඉරානයට එරෙහි එජ යුද්ධයක් මීට වසර 17 කට පමන පෙර කලාපයට සිදු වූ මහා විනාශය ද, ඉරාකයට එරෙහි යුද්ධයෙන් මිලියනයකට වඩා මිය යාමද බොහෝ සෙයින් ඉක්මවා යනු ඇත. එය මුලු කලාපය හා ඇත්ත වශයෙන්ම මුලු ලෝකයම ඒ තුලට ඇද ගැනීමට තර්ජනය කරනු ඇත.

මේ විසින් වොෂින්ටනය මෙම යුද්ධය දියත් කිරීම වලක්වනු ඇතැයි යන මායාවට කිසිවකුත් යන්තම් හෝ යට නොවිය යුතුය. 1938 හි ට්‍රොට්ස්කිගේ වාක්‍ය-ඛන්ඩය භාවිතා කලහොත් එජ පාලක පන්තිය "ව්‍යසනය දෙසට .......... හිමයානයන් දැස් වසාගෙන ලුහුටායාම" දෙස ලොව පුරා මිලියන සංඛ්‍යාත ජනතාව, සංත්‍රාසයෙන් බලාගෙන සිටිති.

ඉරානයට එරෙහි ට්‍රම්ප්ගේ මිලිටරි ප්‍රහාර ප්‍රමාද කිරීම සාමය කරා යන මාවතක් විවර කරන බවට වන සියලු ප්‍රකාශයන්, වසර 30 ක් තිස්සේ ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියට හේතු වී ඇති යටින් පවතින අර්බුදයෙන් ට්‍රම්ප්ගේ ක්‍රියාමාර්ගයන් වෙන් කිරීමේ වැරැද්ද සිදු කරයි.

පසුගිය දින දෙක තුල සිදු වූ කිසිවක් එජ යේ මිලිටරි අරමුනු වෙනස් කර නැත. මෙම සතියේ අර්බුදය ඇති කල භූ-දේශපාලනික අවශ්‍යතාවයන් නව ඒවා ගෙන එනු ඇත.

මෙම යුද තර්ජනය වනාහි 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසු එජ අධිරාජ්‍යවාදය විසින් අනුගමනය කරන ලද සමස්ත සාහසික මිලිටරිවාදී ප්‍රතිපත්තියේ අවසාන ප්‍රතිඵලයයි. ඇෆ්ගනිස්ථානය සහ ඉරාකයේ සිට ලිබියාව සහ සිරියාව දක්වා ආක්‍රමනකාරී යුද සහ පාලන තන්ත්‍ර මාරු කිරීමේ මෙහෙයුම් මාලාවක්, වොෂිංටනයේ මූලෝපායික අරමුනු කිසිවක් සාක්ෂාත් කර නොදී ව්‍යසනයන් පමනක් අත් කර දී තිබේ. එජ දැන් සිය හමුදා ඉරාකයෙන් නෙරපා දමනු ලැබීමේ අනාගත අවදානමකට පවා මුහුන දී සිටී.

ඉරානයට එරෙහි යුද්ධයට සූදානම් කිරීම " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ " සිට "මහා බල තරගයෙන්" පැන නගින යුද්ධ සඳහා සූදානම් වීම දක්වා මාරුවීම මත පදනම්ව 2018 දී වොෂිංටන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ගෝලීය මූලෝපාය සමග, බැඳී ඇත. ටෙහෙරානයේ යටත් විජිත පන්නයේ රූකඩ පාලන තන්ත්‍රයක් ඇටවීම සහ පර්සියානු ගල්ෆ් කලාපයේ බලශක්ති සැපයුම් පාලනය කිරීම රුසියාව සහ චීනය සමඟ යුද්ධයට අත්‍යවශ්‍ය සූදානමක් ලෙස වොෂින්ටනය දකී.

තවද, ඉරානයට එරෙහි යුද්ධයක් අතිශයින් ලේ වැකි බව විය හැකි නමුත්, එය න්‍යෂ්ටික ගිනිජාලයකට සූදානම් වන පාලක පන්තියක් නතර නොකරනු ඇත.

ඉරානයට එරෙහිව යුද්ධයක් දියත් කරන්නේද නැද්ද යන්න තවදුරටත් ප්‍රශ්නයක් නොවන නමුත් ඒ කවදාද යන්න පමනක් ඉතිරි වෙයි. ගොතන ලද "ආසන්න තර්ජනයක්" මත පදනම්ව ජෙනරාල් සුලෙයිමානි ඝාතනය කිරීම සඳහා කඩතුරාවක් සොයාගත් සේම, මැද පෙරදිග ඕනෑම තැනක, ඕනෑම කෙනෙකු විසින් එජ හමුදාවන්ට කරන සැබෑ හෝ ගොතා රංගගත කරන ලද ප්‍රහාරයක් හෝ "තර්ජනයක්" ඇතැයි කියාපාන තවත් ප්‍රකාශයක් මගින් හෝ අධිරාජ්‍යවාදී ආක්‍රමනය සාධාරනීයකරනය කිරීම ප්‍රමානවත් වනු ඇත.

රුසියාවට එරෙහිව ප්‍රමානවත් තරම් ආක්‍රමනශීලී නොවීම හේතුවෙන් ඔහුගේ පාලනාධිකාරයට විරුද්ධ වීමේ දී මිලිටරි හා බුද්ධි අංශවල දේශපාලන හොරනෑ ලෙස සේවය කල, බියගුලු ඩිමොක්‍රටික් පක්ෂයේ ට්‍රම්ප්ට එරෙහි දේශපාලන විරුද්ධවාදීන් ලෙස පෙනී සිටින්නන් විසින් යුද්ධයක් නතර නොකරනු ඇත.

තමන් පහලින් මහජන විරෝධයට මුහුන දෙමින් සිටිද්දී පවා අධිරාජ්‍යවාදය සමඟ ගනුදෙනුවකට යාමට වෑයම් කරන ටෙහෙරානයේ ධනේශ්වර පූජක ආන්ඩුවේ උපාමාරු ද ඇතුලුව ලෝකයේ කිසිදු ආන්ඩුවක් විසින් යුද්ධය නවත්වනු නොලබනු ඇත.

යුද්ධයට එරෙහිව ලෝක ධනේශ්වරයේ තාර්කිකත්වයට කරන ඕනෑම ආයාචනයක් නිෂ්ඵල ය. මන්දයත් යුද්ධය සෘජුවම පැන නගින්නේ ධනවාදයේ අතාර්කිකත්වය සහ ජාතික රාජ්‍ය ක්‍රමය සහ ලෝක ආර්ථිකය අතර ඇති නොවිසඳිය හැකි පරස්පර විරෝධතාවයෙන් ය.

ට්‍රම්ප්ගේ ප්‍රමාද කරන උපක්‍රමය යුද්ධයට එරෙහිව සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා වන සටනෙහි කිසිදු අඩුවක් ඇති නොකල යුතුය. වඩාත්ම හදිසි හා ක්ෂනික කර්තව්‍යය වන්නේ යුද්ධයට එරෙහි අරගලය අධිරාජ්‍යවාදය අවසන් කිරීමේ මහා යුද විරෝධී ව්‍යාපාරයක් බිහිවීමට සහ සමාජවාදී පදනම් මත සමාජය ප්‍රතිසංවිධානය කිරීමට ප්‍රබල පදනමක් සපයන කම්කරු පන්ති අරගලයේ ගෝලීය නැගීම සමඟ සම්බන්ධ කිරීමයි.

**බිල් වැන් ඕකන් සහ ඩේවිඩ් නෝර්ත්**

© www.wsws.org